# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

| නර්තනය | 09 ශ්‍රේණිය | කාලය පැය දෙකකි |
|---|---|---|

**නම: ..............................................................**

## I කොටස

- **සුදුසු පිළිතුර තෝරන්න.**

1) ලය ප්‍රභේද ගණනින්,

i. දෙකකි. ii. තුනකි. iii. හතරකි. iv. පහකි.

2) තෙයියත් තෙයි තා.... මෙහි ඉතිරි පද කොටස වන්නේ,

i. තිත් තිත් තෙයි. ii. තා තෙයි තා.
iii. තිත් තෙයි තත් තා. iv. තෙයි තිත් තත් තා.

3) මාත්‍රා 4 + 4 තාල තිතේ තාලයට අයත් බෙරපදයකි.

i. දොං ජිංත ගත දොංත. ii. ජිං ගත ගොංගා.
iii. දොං දෙජිං ගත iv. දොදොංත තකු දොං

4) තකට තකට තක තරිකිට තුන්දත් තා තක ජිජිකුද මෙය,

i. 9 වන ගොඩ සරඹයේ කස්තිරමය. ii. 10 වන ගොඩ සරඹයේ කස්තිරමය
iii. 7 වන ගොඩ සරඹයේ කස්තිරමය iv. 11 වන ගොඩ සරඹයේ කස්තිරමය

5) කඩතුරා ගායනයකට අදාළ ගී පාදයකි,

i. ගණදෙවියන්ගේ කෝවිල ගාවා.
ii. සිරස සවන් යුග මුඛ තුළ බෙල්ලේ.
iii. වහන්ස නුඹ අප අතහැර මන්ද මහණ වුණ
iv. ආයු බෝ වේවා කළ සෙත් මුදුන් වේවා.

6) ''කොනින් කොනට පන් උදුරා ගන්නේ'' යන ගායනයට අදාළ තිත් රූපය වන්නේ,

i. 2 + 2ය ii. 3 + 3ය iii. 4 + 4ය iv. 2 + 3ය

7) උඩරට බෙර වාදනයේ දී සතර බීජාක්ෂර නමින් හැඳින්වෙන්නේ,

i. ගත් තකු ජිත් තම්. ii. තත් ජිත් තක ජිත් තං
iii. තක් ජිත් තොං නං. iv. ගත් ජිත් තක ජිත්.

8) දො දොංත තකු දොං මෙම බෙර පදය අයත් වන්නේ,

i. සැවුලා වන්නමටය. ii. තුරඟා වන්නමට ය.
iii. වෛරොඩි වන්නමටය. iv. සිංහරාජ වන්නමටය.

9) 'කැඩපත ගන්නී සුරතින් මුහුණ බලන්නි' මෙය,

i. කෝලම් කවියකි කොටසකි.

ii. සොකරි කවියක කොටසකි.

iii. නූර්ති ගායනයක කොටසකි.

iv. නාඩගම් ගායනයක කොටසකි.

10) ශෝකය නමැති ස්ථායි භාවයෙන් උපදින රසය වන්නේ,

i. කරුණා ii. භයානක. iii. හාස්‍ය iv. වීර

11) එස්. පණී භාරත, කේ.එස්. ප්‍රනාන්දු, හීන් නිලමේ යන ශිල්පීන් පිළිවෙලින්,

i. පහතරට, උඩරට, සබරගමු නර්තන ශිල්පීන්ය.

ii. උඩරට, සබරගමු, පහතරට නර්තන ශිල්පීන් ය.

iii. උඩරට, පහතරට, සබරගමු නර්තන ශිල්පීන් ය.

iv. සබරගමු, පහතරට, උඩරට නර්තන ශිල්පීන්ය.

12) මහනුවර දළඳා පෙරහැරෙහි නර්තන අංග සඳහා

i. කාන්තා නර්තන අංග පමණක් දැකිය හැකිය.

ii. කාන්තා හා පිරිමි නර්තන අංග පමණක් දැකිය හැකිය.

iii. බාලිකා නර්තන පමණක් දැකිය හැකිය.

iv. පිරිමි නර්තන අංග පමණක් දැකිය හැකිය.

13) හිසේ සිට පාදාන්තය දක්වා රෝග නිවාරණය සඳහා කරන ගායනා විශේෂයකි.

i. ග්‍රහ කවි. ii. සිරස පාද කවි.

iii. කඩතුරා කවි iv. ආශිර්වාද කවි.

14) මාත්‍රා 2 + 4 දෙතිතට අයත් බෙර පදයකි.

i. දොං ජිංත ගත දොංත ii. දොං දොං ජිං ජිං ගජිගත

iii. දොං දොං ජිං ගත. iv. දොං ජිං ජිං තකට දොං තත.

15) භරත නැටුම් හදාරණ ආධුනිකයින්ගේ කළ එළි දැක්ම හඳුන්වන්නේ,

i. පදම් යනුවෙනි. ii. වර්ණම් යනුවෙනි.

iii. තිල්ලානා යනුවෙනි. iv. අරංගේත්‍රම් යනුවෙනි.

16) මහනුවර ඇසල පෙරහැර පිළිබඳ තොරතුරු වාර්තා කළ දේශාටන වාර්තා කරුවෙකු වන්නේ,

i. ඉබන් බතුතා ii. බස්නායක නිලමේ.

iii. රොබට් නොක්ස් iv. ගණිතාලංකාර.

17) 9 වන ගොඩ සරඹයේ සරඹ නාමය වන්නේ,

i. අර්ධ චක්‍ර සරඹය. ii. දෑත පෑගීමේ සරඹය.

iii. අංගහාර සරඹය. iv. දෑල සරඹය.

18) තහලම් කළ බෙර තම්මැට පට තන්තිරි ඩමරු ආදී භාණ්ඩ පිළිබඳව විස්තර ඇතුළත් වන්නේ,

i. තිසර සන්දේශයේය
ii. පරවි සන්දේශයේය.
iii. සැළලිහිණි සන්දේශයේය.
iv. කොවුල් සන්දේශයේය.

19) චරිත නිරූපණයේ දී වඩාත් වැදගත් වන්නේ

i. ආංගික හා වාචික අභිනයයි.
ii. ආංගික හා සාත්වික අභිනයයි.
iii. වාචික හා සාත්වික අභිනයයි.
iv. ආහාර්ය හා වාචික අභිනයයි.

20) උඩරට නර්තන අංග දැකිය හැකි ප්‍රසිද්ධ පෙරහැරකි,

i. සමන් දේවාල පෙරහැර.
ii. දෙවිනුවර පෙරහැර.
iii. නුවර ඇසල පෙරහැර.
iv. ගංගාරාම පෙරහැර.

## II කොටස

- **ඔබ කැමති ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.**

1)

i. නර්තනයේ දී ශාරීරික ස්වස්තතාවන් ඇති ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ල. 05)

ii. ඒවා පවත්වාගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න. (ල. 05)

2)

i. ගැට බෙරය වාදනය කරන අවස්ථා හතරක් සඳහන් කරන්න. (ල. 04)

ii. බෙරය සෑදීමට ගන්නා දැව වර්ග 4 ක් ලියන්න. (ල. 02)

iii. ගැට බෙරයක දළ රූපසටහනක් ඇඳ එහි කොටස් හතරක් නම් කරන්න. (ල. 04)

3)

i. වෛරෝඩි වන්නමේ බෙර පදය, තානම, කවියක් ලියන්න. (ල. 05)

ii. එහි බෙර පදය හා කවි පදයක් ප්‍රස්තාර කරන්න. (ල. 05)

4)

i. සන්දේශ කාව්‍ය අතුරින් නළඟන රැගුම් විස්තර කෙරෙන සන්දේශ කාව්‍ය නම් කරන්න. (ල. 02)

ii. එහි එන ගී පාදයක් ලියා දක්වන්න. (ල. 03)

iii. කුස්පෙරුම හෝ කොරවක්ගල, සෙල් ලිපි වලින් නර්තනය පැවති බවට සාධකයක් ලියන්න. (ල. 05)

5)

i. මාත්‍රා 4 + 4 තනි තිතේ තාලයට බෙර පදයක් හා කවි පදයක් ලියන්න. (ල. 05)

ii. කඩතුරා කවියක් ලියා දක්වන්න. (ල. 05)